# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1724/7 - 2011 සැප්තැම්බර් 21 වැනි බදාදා - 2011.09.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති හා නාගරික සංවර්ධන අධිකාරියේ විෂයභාර අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත සඳහන් උප ලේඛනයේ විස්තර කර ඇති ඉඩම් කොටස් රඹුක්කන නගර සංවර්ධන කටයුතු යටතේ යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා වහා අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්, අදාළ ඉඩම් කොටස් එකී කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය.

2011 ජූලි මස 10 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, රඹුක්කන ගමේ පිහිටියාවූද, බලයලත් මිනින්දෝරු හා තලම්තිකරු ආර්. එන්. කරුණාතිලක මහතා විසින් මැන පිළියෙල කරන ලද අංක 2432 ඒ හා 2008.08.27 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 1 සිට 6 දක්වා වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.0576 ක් (අක්කර 5, රූඩ් 0, පර්චස් 13.51) විශාල ඉඩම් කොටස්.

මායිම් පහත පරිදි වේ.

**කැබලි අංක 1 - විශාලත්වයෙන් හෙක්ටයාර් 0.0526**
**(අක්කර 0, රූඩ් 0, පර්චස් 20.80) ක් වූ දමුනුකුඹුර**

| | | |
|---|---|---|
| උතුරට | - | කුඹුරු ඉඩම් ; |
| නැගෙනහිරට | - | ඇළ ; |
| දකුණට | - | ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 2; |
| බටහිරට | - | ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 2. |

**කැබලි අංක 2 - විශාලත්වයෙන් හෙක්ටයාර් 0.8557**
**(අක්කර 02, රූඩ් 0, පර්චස් 18.32) ක් වූ දමුනුකුඹුර**

| | | |
|---|---|---|
| උතුරට | - | කුඹුරු ඉඩම්, ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 1 හා ඇළ ; |
| නැගෙනහිරට | - | ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 3 හා 4 ; |
| දකුණට | - | ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 4 හා 5 ; |
| බටහිරට | - | ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 6 හා ගම්වාසීන් අයිතිවාසිකම් කියන ඉඩම. |

**කැබලි අංක 3 - විශාලත්වයෙන් හෙක්ටයාර් 0.0232**
**(අක්කර 0, රූඩ් 0, පර්චස් 9.17) ක් වූ දමුනුකුඹුර**

| | | |
|---|---|---|
| උතුරට | - | ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 2 හා ඇළ ; |
| නැගෙනහිරට | - | ඇළ සහ ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 4 ; |
| දකුණට | - | ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 4 ; |
| බටහිරට | - | ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 2. |

**කැබලි අංක 4 - විශාලත්වයෙන් හෙක්ටයාර් 0.3532**
**(අක්කර 0, රූඩ් 3, පර්චස් 19.64) ක් වූ දමුනුකුඹුර**

| | | |
|---|---|---|
| උතුරට | - | ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 6, 5, 2, 3 හා ඇළ ; |
| නැගෙනහිරට | - | ඇළ සහ සමුපකාර සමිතියට අයත් ඉඩම ; |
| දකුණට | - | ඇළ සහ සමුපකාර සමිතියට අයත් ඉඩම, ලංකා බැංකුවට අයත් ඉඩම සහ දිසානායකට අයත් ඉඩම ; |
| බටහිරට | - | ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 6. |

**කැබලි අංක 5 - විශාලත්වයෙන් හෙක්ටයාර් 0.5528**
**(අක්කර 01, රූඩ් 1, පර්චස් 18.56) ක් වූ දමුනුකුඹුර**

| | | |
|---|---|---|
| උතුරට | - | ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 2 ; |
| නැගෙනහිරට | - | ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 2 හා 4 ; |
| දකුණට | - | ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 4 හා 6 ; |
| බටහිරට | - | ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 6 හා 2. |

**කැබලි අංක 6 - විශාලත්වයෙන් හෙක්ටයාර් 0.2201**
**(අක්කර 0, රූඩ් 2, පර්චස් 7.02) ක් වූ දමුනුකුඹුර**

| | | |
|---|---|---|
| උතුරට | - | ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 2 හා 5 ; |
| නැගෙනහිරට | - | ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 5 හා 4 ; |
| දකුණට | - | ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 6 හා ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම ; |
| බටහිරට | - | ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම හා ගම්වාසීන්ට අයත් ඉඩම. |

09-76

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.